# නිර්මාණ Nirmana

## දරුවන්ගේ දරුවෝ

ඉර හඳ නැගී එක්වර ලොව බැබ ලෙනවා
දිවියට හෙටක් ඇති බව අද වැට හෙනවා
දරු තුන්දෙනාගේ දරුවන් හිනැ හෙනවා
නිවහන මගේ මහ මැදුරක සිරි දෙනවා

චතු-කවි-ජාන්වී-ටයිනී-හංස පුතා
පවසන තොදොල් බස් සවනට සුවය ඉතා
මල් වැනි සුවඳ කිරි දරුවන් කියති කතා
හද තුළ දරු සෙනේ මහමෙර තරම වෙතා

බිත්තිය පුරා හැඩ වැඩ සිතුවම් ඇඳලා
පොල්පිතු ගොනුන් මිදුලේ සිව් අත බැඳලා
සෙල්ලම් ගෙවල් වටකර තිර රෙදි ඇඳලා
පොල්කටු වළං වල රස වැලි බත් ඉදිලා

දහවල රැය කියා වෙනසක් නැත දන්නේ
කඩිගුල ඇවිස්සුණ ගානයි දහලන්නේ
මුනුපුරු මිනිපිරින් මගෙ ලෝකය වන්නේ
දෙවියන් පඩුරු පිණිසයි දෝතට දුන්නේ

පෙවමට බැරි වුනත් කිරිකර රුහිරු ගත
මව් සෙනෙහස නොවේ ඊටත් වැඩිය හිත
සිව් මහ දෙවිවරුන් වැඩ හිඳ සතර අත
සිව් විසි පැයේ දරු පැටවුන් රකිනු ඇත

දරුවන්ටත් වඩා දරුවන්ගේ දරුවෝ
උණුහුම දිදී අපෙ ජීවිත හැඩ කෙරුවෝ
සමනල වියේ මුත් අද ගුණ නැණ දැරුවෝ
වියතුන් සබා මැද හෙට දිදුලන විරුවෝ

♦ *රත්නා ලංකා අබේවික්‍රම*
**Sri Lanka**

## කෝවුල් ගීත



බස්පොලවල්වල
ටිකට් කූඩුවල
පදිකවේදිකාවල
සිනමාහල් වල
මහමන්දිර සඳළුතලවල
අතුපැලවල්වල කඩපිල්වල
මීවිතේ ගී ඉතිරෙන තැන්වල
ඇසුණා දසතම රැව්දෙමින්
ජෝතිපාලගේ සිංදු

මතකයි මට
ඉස්කෝලේදි තරඟෙකට මමත් කියුවා
පිළිගන්න මම ඡන්න ඇමතී වෙමී
සුපර්ස්ටාර් තරඟේ අයත් කිව්වා
මල් පිබිදන එක වසන්ත සමයක
ඩොල්කියක් වයමින් අන්ධගායකයෙක් කියුවා
ආලෝකේ අතීතේ කඳුළින් මැවෙවී
මගුල් ගෙදරක ගායකයෙක් කියුවා
අද අමුතුම රැයකී
ඉස්සර උදේ රේඩියෝවේ නිතරම ඇසුණා
සමනළ මුදුනේ සිරිපද සිඹ සිඹ

ජනතා ආත්මයේ
සදා නිධන්වූ ගී මුතු
කෙසේ නම් අතීතයන්ගේ මනැසින් බිහිවී
මුසුවුනිද ජෝතිමත් සුසුම් සමග

ඔබගේ ගී සිහින අහසේ
අප සිත් තාරකා මල්
දිලිසෙයි නිදහසේ
ඔහේ පියඹති රංචු ගැසීලා කුරුල්ලෝ
තව බොහෝ කාලයක්
නිම්තෙරක් කිව නොහැකි තරම්

♦ *මහින්ද ප්‍රසාද් මස්ඉඹුල*
**ගොඩකවෙල Sri Lanka**

## ලංකාවිත්ති කතුවරයාට

හෙළ බස සුරකිමින් අදරින් මව ලෙසට
කළ සේවය යසයි දුරු රට වැසි සැමට
ඔබ හෙළ පුතෙකි යුතුකම් දන්නා හොඳට
මම හිස නමමි දසවස කළ සේවයට

සේවයෙ මහිම පැතිරී ඇත දස දෙසට
නෙක රට වසන සිහළුන් දෙයි තුති ඔබට
ඇති කළ ඇල්ම අභිමානය සිය බසට
ඔබ සම්පතකි පින පල දුන් ලක් මවට

ඔබ වන් පුතෙකු ලද අම්මා පින්වත් ය
දෙස බස ඔබ නිසා ලොව තුළ ඔපවත් ය
කළ සේවය අගෙයි පින් පල ඉමහත් ය
මේ පින් බෙලෙන් ඔබ දිගු කල් වැජඹෙත් ය

♦ *මධුරි අබේවික්‍රම*
Harrow **UK**



## මනාලියකට

**ප්‍රේමයේ මල් කැකුළු පුබුදු වී**
**දසන්තය සුවඳ දෙන**
**නටා ගයා වයා**
**නැමිතුරු සතුටින් පිනායන**
**ජය කණුව වෙත පැමිණි**
**සියළු බාධා මැඩ පියා**
**කුරුල්ලන් ගී ගයන**
**වසන්තය සිනාසෙන**

**යුග ගීතයක් වේවි**
**තනිව ගැයූ ඔබ ස්වරය**
**ගොඩනගන්න කැදැල්ල**
**ඉවසීමෙන් හෙමින් හෙමින්**

**ඉඳහිට පය පැකිලෙන විට**
**දිගුකරමි අත ඔබට**
**හැරම්ටිය පසෙක ලා**
**දරු සෙනෙහසින්**

**පියනගන්න අනාගතයට**
**විසඳන්න ජීවිතේ ගැටළුව**
**පුරවන්න හිස් තැන්**
**රඳවන්න! සිනාවක් හදවත**

♦ ***මෛත්‍රී පනාගෙඩ***
**NSW Australia**

**Sarcasm සාවඥබව**
Sarcasm has the lowest form of wit and the highest form of vulgarity. - **Anon**
**සාවඥවීම බුද්ධියේ පහත්ම තත්වයයි. එය අසභ්‍යබවේ ඉහළම තත්වයයි.**

## ගිහින් ඔබ ඇතටම

සඳ වහන් වී ගිහින් ඔබ වාගේම
තරු ඇසුත් වැහිලා ගිහින් සීතලටම
මම තරම් කෙනෙක් නෑ කියූ ඔබම
ගිහින් ඇතට මා අමතක කරලම

මහා වැහි වහිනවා එදා වාගෙම
පුංචි මල් කූඩෙ තියෙනව තාමත් මා ගාවම
කුඩේ යටින් යන්න ආසයි ඔබත් එක්කම
ඔබ නැති එක දුකක් මට බැහැ යන්න තනියම

සීතලයි කියන්නෙ කොහොමද මට
ඔබ ළඟකවත් නැහැනෙ මට තුරුළු වෙන්නට
මම පාළුයි කියන්නෙ කොහොමද මට
හිත පුරා ඉඳ ඔබ දහකරන කොට

මට ඔබ ඔබට මම අහිමි වුනාද
අපි අපේ වන්නට සිතූ සිහින බොඳ වුනාද
මේ භවයෙ ඔබ මගෙන් ඈත්ම වුනාද
එන භවයෙ පතන්නම් ඔබ මටම හිමි වෙනවද

♦ *ඈන් ප්‍රියාංගනී*
**Cyprus**

## බලු සූරතලා

ගෙදරක හදන බලු පැටියෙක් හරි වසය
කඩයෙන් ටින් කෑම ගෙනැවිත් දෙන්නේය
ගේ හිමි සිටින විට නම් උං රජාය
ඔහු නැති විටදි බල්ලා හරි අගේය

නැතිවිට හාම් පුතු මූ කාටත් බයය
එවිට නිදා ගන්නේ බිම තමාය
ඇති විට ඔහු ගෙදර මූ නිදි ඇඳ උඩය
ළං වෙන කාට මුත් මුගෙ රැස් පෙන්නාය

බල්ලට ලැබෙන සැප සම්පත් දුටු වාම
තරහක් දැනෙනවා සිත යට නොදැ නීම
සිහමන් යදින්නන් නගරයෙ ඇත බෝම
නොසිතන්නේ ඇයිද ඒ අය ගැන ඒම

## රෝ සයනයේ ඉඳ

ගුරු ලෝකයේ හතළිස් වසරක් විතර
පෙන්වා දුනිමි සිසුනට යහමග නිතර
අද මා සිටින මුත් ගත දුබලව වැතිර
අමතක නොවෙයි කිසි විට සිසු ලොව මිහිර

දෙන අදහසින් සිසුනගෙ දියුණුව සලසා
අද මෙන් මුදල් උපයන්නට නොම විමසා
අමතර පැය ගණන් නොතකා කිසි වෙහසා
දුන්නෙමු ලබා ඔවුනට සිප් සත නොලසා

සමුගෙන විදුහලින් සරසවියට තේරී
යන විට සිසුන් හද ගියෙ සතුටින් ඉතිරී
පැතුවෙමි අනාගතයක් ඔවුනට මිහිරී
ජය කණු වෙතම ගියෙ උන් ආ පසු නොහැරී

යහගුණ දහම් ගිය සෝදා පාළුවට
සුවයක් ගෙන නොදෙයි සිසු ලෝකයෙ දැනට
මා ගුරු මවක වූ කාලය එයි සිතට
සුවචයි එකල සිසු දරුවන් ගුරුන් හට

මා දියණියක ලෙස ලක්මැණිගෙ පවර
ජනිතව ගෙවූ මේ ජීවිතයෙහි නොතිර
නෑ හිතවතුන්ටත් හැකි හැමටත් නිතර
කළ උපකාර සිහිකර තුටුවෙමි වැතිර

පිළියම් ලබාගන්නට රෝහල් ගතවී
සතියක් ගෙවූවෙමි රෝගින් හට මැදිවී
තරමක සුවය ලැබ ආවත් ඉන් පිටවී
අදටත් සිටිමි මම රෝ සයනේ ඇලවී

**විශ්‍රාමික විදුහල්පතිනි**
♦ **ප්‍රේමා අදිකාරි**
Morden Surrey **UK**

## වස් කාලය ඇවිදින්

ඇරඹුණී වස්සාන කාලය නිසි කලට
සැරසුණී යතිවරුන් සැම වස් වැසීමට
සැනසුණී අසා සිත හිමිවරු දෙසූ බණට
පිවිසුණී සිත කයද ඒ සදහම් මගට

පන්සල ගමද එක්වන කාලය ඇවිදින්
පිසගෙන අහර පිනි පුදදීමට මැනවින්
යති වෙහෙරට පුරා සිත ඉපිලෙන සතොසින්
පින් අත්කර ගනිති සසරෙහි දුක නසමින්

පූජාවක්ය කටිනය බුදු හිමි යන්ට
එම තුම් සිරිත නිමවෙයි වැසි නිමා වට
මහ සඟරුවන සුදිලෙන මුර ටැඹ ලෙසට
සුරකී බුදු දහම අද දින මෙන් හෙටට

♦ *අංජලී දිල්රුක්ෂි රත්නායක*
**Montreal, France**

## දැයෙන් සමුගත් මහා විද්වතා



ඔහු දිනූ පියස බණ්ඩරවෙල පැත්තේය
ඉගෙනුම දත් ශිල්ප නැගි හිණී පෙත්තේය
සිය රට සමාජය පිරිසිඳ දත්තේය
ඒ විද්වතා මරු තුරුලට ගත්තේය

දුප්පත් දුගී පැල්පතෙ ඇති දුක දුටුවා
ඔබ සා උතුම් මිනිසෙකු යළි නොම ඇතිවා
ලක්දිව හැම දෙනට දිවියෙහි තතු පැවා
නැවතත් වරක් අප අතරම උපදීවා

අප රට තිබෙන කුණුකන්දල් ඉවත දමා
ඔබ දුටුවේය හරි පැත්තම නැතිව පමා
ඒ ඔවදන් ගතොත් මනසට දිරිය යොමා
කොඩියක් වගේ සිරිලක වැජඹේ නොපමා

ලක්දිව සමාජය ගැන තතු කියනව ද
ඔහි නැති බැරි අයට ඔබ සෙත සදනව ද
දෙවියොත් ඔබේ ඔවදන් පිළිපදිනව ද
තොරතුරු රැගෙන යළි අප වෙත එනවා ද?

*(මේ නොබෝදා අභාවප්‍රාප්ත මහාචාර්ය නන්දසේන රත්නපාල මහතා වෙනුවෙනි)*

♦ *එස් කංකානම්ගේ*
**London SW 2**



එළියට දිව දමයි
ලෙවකයි කට මූණ
පොඩි දරුවෙක් වගේ
හරහට වඩාගෙන
ගෙහි හිමි නිදයි
සැටියේ කට අයාගෙන
බල්ලා නිදයි උකුලේ
උඩ බලාගෙන

♦ *රත්නාවලි කුමාරි දිසානායක*
Hounslow Middx **UK**



## ඒ සුන්දර පාසැල් සමය

සුදු ගවුම කහපාට ටයි පටිය බැඳ කරේ
කරල් දෙකකට ගෙතූ වරල පිට මැද පොරේ
දහකාර සිසුවියක ලෙසින් ගත කළ සමේ
ජීවිතේ සුන්දරම අවදියයි මට සිතේ

කෙහෙල් ලෙල්ලක් එල්ලගෙන මොකද මේ කරේ
කොලොප්පන් වදන් මහ යනෙන අතරේ ඇසේ
කොලු රැළට ඔරවමින් අමනාපයෙන් සිතේ
ගිය අයුරු මතක් වී මුවට හසරැළි නැගේ

යෙහෙළියන් හා එක්ව කිචි බිචිය හැම වෙලේ
වේදිකාවයි අපේ හපන්කම් ඔප කළේ
දෙවිවරුන් වැනි ගුරුන්ගෙන් ඔවා හැම කලේ
කොයි තරම් සරල දිවියක්ද අප ගත කළේ

බොහොම ඕනෑකමින් තුටින් පාඩම් කළා
ඔවා හරබර අපේ දිවිය නිති එළි කළා
ළමා විය ගෙවී පාසැල් දිවිය නිම වෙලා
ගියත් සුන්දර සමය සිතේ නෑ බොඳ වෙලා

♦ *ශ්‍රීපාලි කොටුවැල්ල*
**Ca, USA**

## මැද පෙරදිග නුඹ

අනෝර වැසි මැද කඩමලු පැදුරක
නොනිදා නොපියා දුටු මල් සිහිනේ
එළිකර ගන්නට සිතුනාදෝ

පෙම් පිරු සිතකින් නොසිඳි සවියගෙන
සියුමැලි දෑතින් යෝද බලය ගෙන
ළඳ නුඹ දුරු රට වැඩියාදෝ

ගිනියම් කතරේ බොර තෙල් පොළවේ
බැදෙන නුඹේ ගත මිරිකුණු දාඩිය
රන් කහවණු වී පිපුණාදෝ

අනේක දුක් මැද කඳුළු වතුර ඉස
පිපි ඒ මල්වල අගය නුඹට මිස
කාට කොහොම නම් දැනුණාදෝ

♦ *ශ්‍රියා කුමාරසිංහ*
**New Zealand**

## කරුණාවෙන් සවන්දෙන්න !

**ලංකාවිත්ති නිර්මාණ තීරයට කවි ලියා එවන ආධුනික කවියන්ට හා කිවිඳියන්ට පණිවුඩයකි මේ.**

සඳැස් හා නිසඳැස් යයි දැනට කවි දෙවර්ගයකට බෙදේ. තවත් බෙදීම් තිබිය හැක.

සඳැස් කවි ලිවීම බොහෝ දෙනා සිතන ලෙස ලෙහෙසි පහසු කාර්‍යයක් නොවේ. එය ඉතා ලේසි වැඩක් ලෙස පෙනුනත් එය එසේ නොවේ. යොදන වචන මෙන්ම එහි අදහස් ද කාව්‍යමය එමෙන්ම මටසිළිටි විය යුතු ය. යෙදුම් අතින් අළුත් විය යුතු ය. කවි ලියන ගළපන ආකාරය දැනගත යුතු ය. හොඳම ක්‍රමය නූතන මෙන්ම පැරණි කවියන් විසින් රචනාකරන ලද ඔබට තේරුම් ගැනීමට පහසු කවි පංති කියවා ඒවා ලියා ඇති ආකාරය මැනවින් පිරික්සා බැලීමයි.

කවියයි සිතා ඔබ අපට ලියා එවන ඕනෑම දෙයක් පත්‍රයේ පළකළ නොහැකියි. ඒ එවන සමහර සඳැස් කවි, කවි නොවේ. එකම කවියේ ඇතැම් පේළි දිග ය. ඇතැම් ඒවා කොට ය. ලියූ කවි තාලයට කියවිය නොහැකි නම් එහි වැරදි ඇති බව සිත තබාගන්න.

පැරණි කවිපොත් සොයාගෙන ඒවා හඬ නගා කියවා තාලය අල්ලා ගන්න. ඒ තාලය සිත තබාගෙන සඳැස් කවි නිර්මාණ කිරීමට යොමුවන්න. මහන්සිගන්න.

මෙසේ ලියුවේ ඔබ අධෛර්‍යමත් කිරීමට නොවේ. කවි ලිවීමට ඔබ දිරිගැන්වීම සඳහාය.